# Buddhist attitude towards the usage of logic

## තර්කයේ භාවිතාව පිළිබඳ බෞද්ධ ආකල්පය

Karapikkada Sobitha

කරපික්කඩ සෝභිත හිමි

### සාරසංක්ෂේපය

බටහිර දර්ශනය පදනම්ව වර්තමානයේ තර්ක ශාස්ත්‍රය යනුවෙන් විද්‍යාවක් නිර්මාණය වී තිබුණ ද, තර්කය පිළිබඳ ප්‍රාග් බෞද්ධ යුගයේ පටන් කරුණු දක්නට ලැබේ. එම යුගයේ පටන් ක්‍රමයෙන් සංවර්ධනය වන්නා වූ තර්කය, උපනිශද් යුගයන්හි දී වඩාත් දියුණුවට පත්ව ඇත. මෙම තර්කයේ ආභාෂය බුදුසමය තුළ ද දැකගත හැකි වේ. බුදුරජාණන් වහන්සේ ද බොහෝ අවස්ථාවල දී තාර්කිකව ධර්ම දේශනා සිදුකොට ඇති ආකාරය මුල් බුදුසමය තුළින් අනාවරණය වේ. බුද්ධකාලීන සමාජය තුළ තර්කය ඥානමාර්ගයක් ලෙස භාවිතා කරනු ලැබුව ද, බුදුසමය තර්කය පිළිබඳ දක්වන්නේ වෙනස් වූ ආකල්පයකි. මෙම ශාස්ත්‍රීය අධ්‍යයනය තුළින් තර්කය පිළිබඳ බුදුසමය දැක්වූ ආකල්පය සහ බුදුසමයට අනුව එහි වන්නා වූ සප්‍රයෝජනතාවන් හා නිෂ්ප්‍රයෝජනතාවන් පිළිබඳ මූලාශ්‍රයගත සාධක මත පදනම්ව අධ්‍යයනය කිරීමට අපේක්ෂිතය.

**ප්‍රමුඛ පද ;** තර්කය, ඥානය, ප්‍රත්‍යක්ෂය, සප්‍රයෝජනතා, දෘෂ්ඨිය.

### හැඳින්වීම

"තර්කය" යනු කුමක්දැයි විමසීමේ දී ඒ සඳහා නොයෙකුත් අදහස්, මතවාද, නිර්වචන ඉදිරිපත් වී ඇත. ඒ සියල්ලෙහි සංවර්ධනයක් ලෙස නූතනයේ දී බටහිර දර්ශනයට අනුව "Logic" හෙවත් "තර්කශාස්ත්‍රය" යනුවෙන් විෂයක් නිර්මාණය වුව ද, තර්කය පිළිබඳ තොරතුරු දක්නට ලැබෙනුයේ ප්‍රාග්බෞද්ධ යුගයේ පටන් ය. ප්‍රාග්බෞද්ධ මිනිසා මෝක්ෂය පිණිස ඥානමාර්ගය සෙවීමේ ක්‍රමයක් ලෙස තර්කය උපයෝගී කොටගෙන ඇත. එහි දී ඔවුන් තර්කය නැමැති පාරිභාෂික පදය භාවිතා නොකළ ද, "සහේතුක බව" යන අරුතින් තර්කය යොදාගත් බවට නිදසුන් දැකගත හැකිය. මෙහි දී යම් අදහසක් අන්‍යයන් තුළ තහවුරු කිරීමේ අරමුණින් ඔවුන් තර්කය යොදාගෙන ඇති අතර, ඒ අනුව ප්‍රාග් බෞද්ධ මිනිසා තර්කය මඟින්, වෛදික පුද පූජාවන් කෙබඳු අවශ්‍යතාවයක් සඳහා යොදාගන්නේ ද යන්න තම අනුගාමිකයන්ගේ අවබෝධය වැඩිකරලීමට සමත් වී ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස වෛදික ජනයා කර්ම මාර්ගයෙන් ඥාන මාර්ගයට ක්‍රමයෙන් ක්‍රමයෙන් පිවිසෙන්නට ඇතැයි සිතිය හැක. ***"වාකෝ වාක්‍ය"*** නමින් වේද පාඨවල නිතර සඳහන් වන්නේ මෙම තර්කය බව සංඛර නැමැති ප්‍රකට හින්දු විචාරකයා පවසයි.

උපනිෂද් යුගය වනවිට වෛදික යුගයේ දක්නට ලැබූ මෙම තාර්කික චින්තනය වඩාත් සංවර්ධනය වූ ආකාරය දක්නට ලැබේ. මිනිසා පිළිබඳ සත්‍ය කුමක් ද? බාහිර ලෝකය පිළිබඳ සත්‍ය

කුමක් ද? මේ අතර ඇති සම්බන්ධය කුමක් ද? ආදී දාර්ශනික ගැටලු මෙකල සාකච්ඡාවට බඳුන් වූ බැවින්, මිනිසා මෙහි දී නිතැතින් ම තාර්කික චින්තනයට යොමු වූ බව සිතිය හැක. එසේම ඡාන්දෝග්‍ය, බෘහදාරණ්‍යක, තෛත්තරීය, කඨොපනිෂද් යන යුගවල දී ද මිනිසා තුළ මෙම තර්කය පදනම් වූ ඥාන මීමංසාව පිළිබඳ කොතරම් උනන්දුවක් පැවතුනේ ද යන්න තහවුරු කරන ප්‍රකාශ රාශියක් දැකගත හැක.

මෙසේ ප්‍රාග් බෞද්ධ යුගවල මිනිසා තර්කය කවර අවශ්‍යතාවයක් සඳහා භාවිතා කරන ලද්දේ දැයි විමසීමේ දී අවස්ථා කීපයක් ඒ සඳහා දක්විය හැක.

1. තර්කය පදනම් කොටගෙන සත්‍ය විවරණය කිරීමට උත්සහා ගැනීම,
2. තමන් එල්බගත් මතය තර්කානුකූලව ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව,
3. පරවාද තර්කය නැමැති අවියෙන් බිඳ හෙලීමට උත්සුක වීම,
4. මුළු මහත් භාරතයේ ම තර්ක විතර්ක ක්‍රියාත්මක වීම,
5. සැබෑ ඥානය ලබාගැනීමට යෝනිසෝමනසිකාරය හෝ විමර්ශනය අවශ්‍ය බව අවධාරණය කිරීම

මෙම යුගයන්ගෙන් අනතුරුව උදාවන බුදුසමය තුළ තර්කය පිළිබඳ දක්වන්නා වූ අදහස විමසා බැලීමේ දී, බුදුරජාණන් වහන්සේ මේ පිළිබඳ නොයෙකුත් දේශනා සිදුකොට ඇත. එහි දී ලොව ඇත්තා වූ යථාර්ථය පිළිබඳ සත්‍ය ගවේෂණයේ දී තර්කය බුදුසමයෙන් ප්‍රතික්ෂේපිත වූ ඥානමාර්ගයක් ලෙස අං.නි. කාලාම සූත්‍රයේ දී විස්තර වේ.

***''කාලාමයෙනි, තර්කයම ප්‍රමාණකොටගෙන හෝ න්‍යායානුකූල බවට ප්‍රමාණ කොටගෙන හෝ මතුපිට කරුණු ප්‍රත්‍යවේක්ෂණයම ප්‍රමාණ කොටගෙන හෝ..... නොපිළිගනිව්...''[1]***

මෙසේ යථාභූතඥාන දර්ශනයේ දී තර්කය බුදුසමයෙන් ප්‍රතික්ෂේප කරනු ලබන්නේ තර්තය යනු හුදෙක් භාෂාවම පදනම් වූ ඥානමාර්ගයක් බැවිනි. භාෂාමය තර්කනය සත්‍ය ගවේෂණයේ දී ප්‍රමාණවත් සාධකයක් ලෙස බුදුසමය පිළිගන්නේ නැත. භාෂාව යනු ලිඛිතව හෝ වාචිකව තම අදහස් අන්‍යයන් වෙත දැක්වීම පිණිස භාවිතා කරනු ලබන උපකරණයක් බව බුදුසමයේ අදහස යි. එසේම භාෂාව මඟින් සත්‍ය වූ දේ අසත්‍ය ලෙස ද, අසත්‍ය වු දේ සත්‍ය ලෙස ද දැක්වීමේ හැකියාව බුදුරජාණන් වහන්සේ පෙන්වා දී ඇත. උදාන පාළියේ දැක්වෙන ආකාරයට ලොව තාර්කිකයන් වැජඹෙන්නේ බුදුවරු උපදින තුරු පමණක් බව දැක්වේ.

***''එවං ඔභාසිත මෙව තක්කිකානං යාව සම්මාසම්බුද්ධා ලොකෙ නුපපජ්ජන්ති න තක්කිකා සුජ්ඣන්ති නචාපි සාවකා දුද්දිට්ඨී න දුක්ඛා පමුච්චන්ති''[2]***

එසේම අභිධර්මයට අනුව තර්කය යනු චෛතසිකයකි. එහි දී එය ''විතක්ක'' යනුවෙන් දක්වා ඇති අතර, සංකප්ප යනු ද ඊට පර්යාය පදයකි.

***''කතමො තස්මිං සමයෙ විතක්කො හොති. යො තස්මිං සමයෙ තක්කො විතක්කො සංකප්පො''[3]***

සමස්තයක් ලෙස ආදිබෞද්ධ හා පාලි අටුවාවලට අනුව තර්කය පිළිබඳ බෞද්ධ ආකල්පය මෙසේ විනිශ්චය කොට ඇත.

1. තර්කය යනු අප්‍රත්‍යක්‍ෂ ඥානයන් ලැබීමේ උපකරණය යි.
2. එහි කුසල ද ඇත අකුසල ද ඇත.
3. තර්ක ග්‍රාහය දෘෂ්ටියකි.[4]

මේ අකාරයට ප්‍රාග් බෞද්ධ සහ බුද්ධකාලීන සමාජ තුළ දක්නට ලැබූ මෙම තර්කය පිළිබඳ අදහස් ක්‍රමයෙන් යුරෝපයට සංක්‍රමණය වන්නට විය. විශේෂයෙන් හුදු ජයග්‍රහණය පමණක් අරමුණු කොට සිදුකරන ලැබූ ''ජල්ප'' නැමැති වාද සාකච්ඡා බටහිරට සංක්‍රමණය වී ග්‍රීසියේ ඇතැන්ස් නුවර ආශ්‍රිතව ව්‍යාප්ත වූ බවට තොරතුරු හමු වේ. මෙසේ ග්‍රීසිය පදනම්ව සංවර්ධනය වන්නා වූ තර්කය, තර්ක ශාස්ත්‍රයක් බවට පරිවර්තනය වනුයේ එහි පුරෝගාමීව කටයුතු කළ ඇරිස්ටෝටල් පඬිවරයාගෙනි. ඔහු සමකාලීන සමාජයේ පැවති වාද විවාද නිරීක්‍ෂණය කොට, කෘතීන් කීපයක් රචනා කරමින් විෂයකට අවශ්‍ය පදනම සකස් කළේය. ඉන් අනතුරුව තර්ක ශාස්ත්‍රය උදෙසා ***''තර්ක ශස්ත්‍රය යනු චින්තනය පිළිබඳ හදාරන විද්‍යාවයි''*** ආදී නොයෙකුත් නිර්වචන ඉදිරිපත් වී ඇත. මෙසේ ආරම්භ වූ තර්ක ශාස්ත්‍රයේ මූලික අංග කීපයක් දක්නට ඇත.

1. භාෂාව සහ චින්තනය
2. තාර්කික චින්තනය
3. චින්තන නියමයන්[5] යනුවෙනි.

## පර්යේෂණ ගැටලුව

බුදුසමය තුළ තර්කය ප්‍රතික්ෂේපිත ඥානමාර්ගයක් ලෙස දැක්වේ ද?

## පර්යේෂණයේ අරමුණ හා වැදගත්කම

තර්කය පිළිබඳ බුදුසමය දක්වන්නා වූ ආකල්පය විමසා බැලීම මෙම ලිපියෙහි අරමුණ වන අතර මේ තුළින් පාඨකයාට තර්කය ඥානමාර්ගයක් ලෙස සත්‍ය ගවේෂණයේ දී කෙතරම් දුරට උපයෝගි කොටගත හැකි ද එසේම එය බෞද්ධ නිර්ණායකයන්ට අනුව කවර අවස්ථාවකදී බැහැර කළ යුතු දැයි අවබෝධයක් ලබාගත හැක.

## සාකච්ඡාව

බුදුසමය පහළවීමේ දී භාරතීය ඥාන ගවේෂකයින් සත්‍ය සෙවීම උදෙසා උපයෝගී කොටගන්නා ප්‍රධාන ක්‍රමවේද 02 ක් අං.නි. කාලාම සූත්‍රයේ දැක්වේ.

1. ශබ්ද නය
2. තර්ක නය

මෙහි දී "ශබ්ද නය" යනුවෙන් ඔවුන් අනුස්සව ඥානයත්, පරම්පරා ඥානයත්, ඉතිකිරා ඥානයත්, පිටක සම්පදා ඥානයත් උපයෝගී කොටගත් අතර, "තර්ක නය" උදෙසා ආකාරපරිවිතක්කයත්, දිට්ඨිනිජ්ඣානක්ඛන්තියත් උපයෝගී කොටගෙන ඇත. බුදුරජාණන් වහන්සේ යථාභූතඥාන දර්ශනයේ දී මෙම ක්‍රමවේද දෙකම ප්‍රතික්ෂේප කොට ඇති ආකාරය මෙම සූත්‍රය විමසා බැලීමේ දී පෙනීයයි.

මෙසේ බුදුරජාණන් වහන්සේ තර්ක නය හෙවත් තර්කය ප්‍රතික්ෂේප කළ නමුත්, සූත්‍ර දේශනා විමසා බැලීමේ දී උන්වහන්සේ අතැම් අවස්ථාවල දී තර්කයේ දක්නට ලැබෙන සප්‍රයෝජනතාව අවධාරණය කොට ඇති ආකාරය දැකගත හැකිය.

යම් කරුණක් සකාරණව විමර්ශනය කරීමේ දී එහි තාර්කික බව තිබිය යුතු බවත්, යම් කරුණක් අනෙකෙකුට ප්‍රකාශ කිරීමේ දී එහි පැහැදිලි, විධිමත් භාවයක් තිබිය යුතු බවත් බුදුසමය පිළිගනී. එනයින් බුදුරජාණන් වහන්සේ ද කිසිවිටෙක අහේතුකවූත්, අකාරණවූත් කරුණක් නොපිළිගත්හ. උන්වහන්සේ කරුණක් පැහැදිලි කිරීමේ දී ඊට අදාළ වූ විවරණය ද සපයයි. උපමා, උදාහරණ හේතු ද දක්වයි. එසේම උන්වහන්සේගේ දේශනා ක්‍රමවේදයන් පිළිබඳ විමසා බැලිමේ දී ද, නොයෙකුත් තාර්කික ලක්‍ෂණ ඉස්මතු වී ඇති අයුරු දැකගත හැකිය.[6]

මෙසේ බුද්ධ චරිතය පමණක් නොව, බෞද්ධ මූලාශ්‍රය ග්‍රන්ථවල එන තොරතුරු විමසා බැලීමේ දී ද තර්කයේ සප්‍රයෝජනතාවන් සඳහන් වන අවස්ථා රාශියක් දක්නට ඇත.

දී.නි. කස්සපසීහනාද සූත්‍රය, ම.නි. නිවාප සූත්‍රය ආදී සූත්‍රවල දැකවෙන ආකාරයට ප්‍රථමධ්‍යානයට සමවත් වූ පුද්ගලයාට තම සිත තුළ ඇතිවන්නා වූ සිතුවිලි හසුරුවා ගැනීමට, පාලනය කරගැනීමට තර්කය අවශ්‍ය වන බව සඳහන් වේ.

***''සවිතක්කං සවිචාරං විවේකජං පීතිසුඛං පඨමජ්ඣානං....''***

එසේම බුදුරජාණන් වහන්සේ ද අන්‍ය සාමයික දෘෂ්ටීන් පිළිබඳව විචාරාත්මක කරුණු දැක්විමේ දී මෙම තාර්කික ස්වරූපය නිරතුරුව උපයෝගි කොට ඇත. යමක් පිළිබඳව සංසන්දනාත්මකව ද, ගැටලු මතුකරමින් ද, ඒවා විසඳමින් ද කරුණු දැක්වීම බෞද්ධ සම්ප්‍රදායේ ක්‍රමවේදයකි. ඒ අනුව ත්‍රිලක්‍ෂණය, චතුරාර්ය සත්‍යය, පටිච්චසමුප්පාදය වැනි මූල ධර්මමය සාධකයන් ද න්‍යාය ශාස්ත්‍රයේ උපයුක්ත ත්‍රිරූප ලිංගයෙන් සමන්විතව දේශනා කොට ඇති ආකාරය දක්නට ලැබේ.

***''යම්කිසි සමුදය ධර්මයක් වේද ඒ සියල්ල නිරෝධ ධර්මයන් ය.''***

***''ඒකාන්තයෙන් සියලු සංස්කාර ධර්මයෝ අනිත්‍ය වෙත්. ඉපිද නැසෙත්. එම උපපැවය ස්වභාවය සංසිඳීම සැපයෙකි.''[7]***

ආදි බෞද්ධ දේශනා තුළ මෙම තාර්කික සහේතුක ලක්‍ෂණ ප්‍රකටව දක්නට ඇත.

මීට අමතරව තර්කයේ දක්නට ලැබෙන සප්‍රයෝජනතාව පිළිබඳ විමසා බැලිමේ දී ''ධර්මය හා තර්කයෙහි උපයෝගිතාව පිළිබඳ අදහස ඉතා වැදගත් වේ'' බුදුරජාණන් වහන්සේ සිය ධර්ම දේශනා සිදුකොට ඇත්තේ විචාරාත්මකව පිළිගැනීම නිසාය. ***''විචෙසො මයා භික්ඛවෙ ධම්මො දෙසිතො''*** මෙහි විමර්ශනාත්මක බව යනුවෙන් දක්වා ඇත්තේ තාර්කික බවයි. මෙහි දී රන්කරුවෙකු රන් පරීක්‍ෂා කිරිමට රත් කිරීමෙන්, කපා බැලිමෙන්, උරගා බැලීමෙන් ක්‍රියා කරන්නාක් මෙන්, ධර්මය විචාරයෙන් හෙවත් තර්කානුකූලව පිළිගත යුතු බව බුදුදහමේ අදහසයි.

එසේම බුදුදහමේ දැක්වෙන නිර්වාණය සාක්‍ෂාත් කරගැනීම තර්කයෙන් ලැබිය නොහැක්කකි. එය අතීන්‍ද්‍රිය ප්‍රත්‍යක්‍ෂයෙන් ලැබිය යුත්තකි. නමුත් එය අනුන්ට පැහැදිලි කරදීම උදෙසා තර්කය උපයෝගී කොටගත හැකිය. මෙය තර්ක ශාස්ත්‍රයේ "පරාර්ථානුමානය" ලෙස දක්වා ඇත.

එසේම මිනිසාට ලොව පවතින නොයෙකුත් දේ පිළිබඳ සත්‍ය බව සහ අසත්‍ය බව තේරුම් ගැනීමේ දී මෙම තර්කය ඉතා වැදගත් කරුණක් ලෙස සුත්ත නිපාතයේ දැක්වේ.

***''තක්කං ච දිට්ඨීසු පකප්පයිත්වා සච්චං මුසා ඉති ද්වය ධම්මමාහු''***[8]

මීට අමතරව බුදුසමය සහේතුක බව යන අර්ථයෙන් තර්කය පිළිගෙන ඇත. විවිධ වාද පථයන් සිදුකිරීමේ දී ද, නොයෙකුත් ගැටළු අවස්ථා විසඳීමේ දී ද එය සහේතුකව නිරාකරණය කළ යුතු බව සංයුක්ත නිකායේ දැක්වේ.

***''උප්පන්නානං පරප්පවාදං සහධම්මෙන සුනිග්ගහීතං නිග්ගහෙත්වා සප්පාටිහාරියං ධම්මං දෙසෙන්ති''***[9]

එසේම වරක් උපාලි ගෘහපති බුදුරදුන් වෙත පැමිණ වාද කිරීමට අවසර ඉල්ලූ අවස්ථාවේ දී උන්වහන්සේ ප්‍රකාශ කරනුයේ සත්‍ය මත පිහිටා කටයුතු කරන්නේ නම් තමන් වහන්සේ වාද කිරීමට කැමති බවයි.

***''සචෙ ඛො ත්වං ගහපති සච්චෙ පතිට්ඨාය මන්තෙය්‍යාසි සියා නො එත්ථ කථාසල්ලාපොති''***[10]

ධර්මාවබෝධය තුළ ධර්මය සාකච්ඡා කිරීම ඉතා වැදගත් කරුණක් ලෙස මංගල සූත්‍රාදී දේශනා තුළින් පැහැදිලි වේ. ඒ තුළින් මතුවන තාර්කික චින්තනය මඟින් නිවැරදි දේ අවබෝධ කොටගත හැකි බව බුදුන්වහන්සේ පෙන්වා දී ඇත.

***''සාකච්ඡාය භික්ඛවෙ පඤ්ඤා වෙදිතබ්බො''***

ම.නි. සංගාරව සූත්‍රයේ දී ඇතැම් මහණ බමුණන් තර්කය පදනම් කොටගෙන බ්‍රහ්මචරියාවට යොමු වූ අකාරය පිළිබඳව විස්තර දක්වා ඇත.

***''එකෙ සමණ බ්‍රාහ්මණා කෙවලං සද්ධාමත්තකෙන දිට්ඨධම්මාභිඤ්ඤාවොසාන පාරමප්පත්තා ආදි බ්‍රහ්මචරියං පටිජානන්ති සෙය්‍යථාපි තක්කී විමංසී''***[11]

මීට අමතරව තර්කයේ සප්‍රයෝජනතාව පිළිබඳ විමසීමේ දී චතුෂ්කෝටික ක්‍රමය ද පශ්චාත් කාලීන බෞද්ධ චින්තනයන්ගේ ඇගයීමකට ලක් වූ ක්‍රමවේදයක් බව දැක්වේ. එනම්,

1. ඇත
2. නැත
3. ඇත ද නැත ද වේ
4. ඇත ද නැත ද නොවේ[12]

මෙහි දී ඥාන මාර්ගයක් ලෙස මෙම චතුෂ්කෝටිය යම්තාක් දුරට ප්‍රයෝජනවත් වු මාර්ගයක් වුව ද, සත්‍යාවබෝධයේ දී මෙය බුදුසමයෙන් ප්‍රතික්ෂේප වේ. නමුත්, බුදුසමය තුල ඇතැම්

අවස්ථාවන්හි දී මෙම චතුෂ්කෝටික ක්‍රමයට අනුව නොයෙක් සංකල්ප විග්‍රහ කොට ඇති අයුරු ආදි සූත්‍ර දේශනාවල තුළින් දැකගත හැකිය.

මීට අමතරව කාලාම, වීමංසන ආදී සූත්‍ර දේශනාවල බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙන ධර්මය ආදානග්‍රාහීව පිළිනොගෙන, එය විමර්ශනය කොට අවබෝධ කළ යුතුය' යන කරුණ විෂයෙහි මෙම තර්කය යම් උපයෝගීතාවයක් දක්වයි. මෙසේ බුදුදහමේ දක්වන පරමාර්ථ සත්‍ය, අතක්කාවචර, නිපුණ, පණ්ඩිතවේදනීය දහමක් වුව ද, එම පරමාර්ථය කරා යෑමේ දී උපයෝගී වන්නා වූ සම්මුති සත්‍ය අවබෝධ කරගැනීම සඳහා තර්කය බුදුසමය විසින් අනුදක්නා ලද බව පෙනේ.

ඥානමාර්ගයත් ලෙස ඇතැම් කරුණු අවබෝධ කරගැනීමෙහිලා තර්කය සප්‍රයෝජනවත් වුව ද, යථාර්ථය දර්ශනය හෙවත් සත්‍යාවබෝධයේ දී තර්කය බුදුසමයෙන් ප්‍රතික්ෂේප වේ. තර්කය මත පිහටා සත්‍ය සෙවීම නොකළ යුත්තක් ලෙසත්, එයින් මිනිසා වැරදි මාර්ගයකට යොාමු විය හැකි බවත් බුදුරජාණන් වහන්සේ බොහෝ අවස්ථාවල අවධාරණය කොට ඇත.

තර්කයේ දක්නට ලැබෙන නිෂ්ප්‍රයෝජනතාව පෙන්වා දෙන සූත්‍ර ධර්ම අතර, කාලාම සූත්‍රය ඉතා වැදගත් වූවකි. එහි දී බුදුරජාණන් වහන්සේ ***"මා තක්ක හෙතු, මා නය හෙතු"***[13] ආදි වශයෙන් කාලාමයන්ට පෙන්වා දෙනු ලබන්නේ,

***"කාලාමයෙනි, තර්කයම ප්‍රමාණ කොටගෙන හෝ න්‍යායානුකූල බවම ප්‍රමාණ කොට ගෙන හෝ මතුපිට කරුණු ප්‍රත්‍යවේෂණයම ප්‍රමාණ කොටගෙන හෝ..... නොපිළිගනිව්"***[14]

මෙහි දී සත්‍යාවබෝධය සඳහා තර්කය ප්‍රාමාණික කරුණක් ලෙස බුදුසමය නොපිළිගන්නා ආකාරය දක්නට ඇත. මෙසේ තර්කය සත්‍යාවබෝධයේ දී ප්‍රාමාණික නොවන්නේ කුමක් නිසාදැයි විමසීමේ දී, ම. නි. සන්දක සූත්‍රය තුළ ඒ පිළිබඳ කරුණු කීපයක් දැක්වේ.

1. සුතක්කිතං තථා - හරි තර්ක හරි නිගමන
2. සුතක්කිතං අඤ්ඤථා - හරි තර්ක වැරදි නිගමන
3. දුතක්කිතං තථා - වැරදි තර්ක හරි නිගමන
4. දුතක්කිතං අඤ්ඤථා - වැරද තර්ක වැරදි නිගමන[15]

මෙම කරුණුවලට අනුව තර්කයෙන් නිවැරදි නිගමනවලට මෙන්ම වැරදි නිගමනවලට ද පැමිණීමට ප්‍රවණතාවයක් ඇත. එම නිසා සත්‍යාවබෝධයේ දී තර්කය ප්‍රාමාණික කරුණක් ලෙස බුදුසමය කිසිවිටෙක පෙන්වා දෙන්නේ නැත.

එසේම නිගාමී වශයෙන් යොදාගන්නා තර්කය ප්‍රාග් අනුභූත ය. එවැනි ප්‍රාග් අනුභූත තර්කයන් බුදුසමය විසින් පිළිනොගන්නා බව මෙම සූත්‍රයේම විස්තර වේ. එහි තර්කය යන්න දෙපැත්ත කැපෙන කඩුවක් ලෙස දක්වයි. එයින් පරමාර්ථ සත්‍යය සාධනය කළ නොහැක්කා සේම, අවිනිශ්චිත වූ ඥාන මාර්ගයක් බවට ද පත් වේ.

සුත්ත නිපාතයේ කලහවිවාද සූත්‍රයේ දී තර්කයේ අවසානය තුළ කලකෝලාහල ඇතිවීමට ද ඉඩ ඇති ආකාරය විස්තර වේ. සමහරු ද්වේශයෙන්, කෝපයෙන් තර්ක කරති. එහි අවසානය

සිදුවන්නේ නොයෙකුත් කලකෝලාහල නිර්මාණය වීමෙනි.[16] මෙය ''දෘෂ්ටිරාගය'' ලෙස බුදුසමය පෙන්වා දෙයි. එසේම තර්කයේ දී අන්‍ය මත කණ්ඩනය සඳහාම තර්කය යොදාගැනීම වැරදි ක්‍රියාමාර්ගයක් ලෙස සුත්ත නිපාතයේ අත්තුකංසන පාරලම්බන සත්‍යය යටතේ මනාව පෙන්වා දී ඇත.

තර්කයේ දක්නට ලැබෙන තවත් නිෂ්ප්‍රයෝජනතාවක් නම්, එහිම දෘෂ්ටියක් සේ එල්බ කටයුතු කිරීමයි.

***''තක්කං ච දිට්ඨීං ච යෙ අග්ගහෙසුං තෙ ගට්ඨයන්තා විචරන්ති ලොකෙ''***

මෙසේ කටයුතු කිරීමෙන් සත්‍ය යටපත් වන බව ද, නොයෙකුත් ගැටුම් නිර්මාණය වන බව ද බුදුසමය පෙන්වා දෙයි. දී.නි. බ්‍රහ්මජාල සූත්‍රයේ ද තර්ක කරන්නා වූ පුද්ගලයා තම මතයේ ම එල්බ වැරදි මාර්ගයේ ගමන් කරන ආකාරය පෙන්වා දී ඇත.

***''මහණෙනි මෙහි එක්තරා මහණෙක් හෝ බමුණෙක් තර්ක කරන්නේ වෙයි. විමසන්නේ වෙයි. හෙතෙම ඒ ඒ කරුණින් තර්ක කොට විමසුම් නුවණ පමණින් ම මැන බලා ආත්මයත් ලෝකයත් සදාකාලික ය ..... මෙයම සත්‍ය අන් සියල්ල අසත්‍ය යැයි කියයි....... ඒ සත්හුම මෙයින් අන් තැනකට යත්, භවයෙන් භවය යත්. මැරෙත්. මැරී උපදිත්. පෘථිවි ආදී ශාස්වත වස්තූහු ද සදාකාලික යයි තර්කයෙන් උපදවාගත් සිය වැටහීම කියත්.''***[17]

මෙසේ බුදුසමයට අනුව තර්කයන්හි එල්බගත් විට විචාරපූර්වක බව මිනිසාගෙන් දුරස් වේ. එය මිථ්‍යාඥාන අවයවයක් බවට පත් වේ. එසේම තර්කය මඟින් සත්‍ය බහුත්‍වයක් ද නිර්මාණය වේ. දී.නි. බ්‍රහ්මජාල සූත්‍රයට අනුව මෙසේ නිර්මාණය වූ දෘෂ්ටි දර්ශනයන් දෙසැටක් පිළිබඳව විස්තර වේ. ම.නි. අග්ගිවච්ඡගොත්ත සූත්‍රය, චූලමාලුක්‍යපුත්ත සූත්‍රය, සං.නි. අචේලකස්සප සූත්‍රය ආදී සූත්‍රවල ද සුත්ත නිපාතයේ අට්ඨක වග්ගයේ ද දක්නට ලැබෙන්නේ තර්කය මත ගොඩනැගී ඇත්තා වූ සත්‍ය බහුත්‍වයන් පිළිබඳව ය. ලොව මෙසේ සත්‍ය බහුත්‍වයක් නිර්මාණය වීමෙන් මිනිසාට නියම සත්‍යය කුමක්දැයි නිවැරදි ව නිශ්චය කොටගත නොහැකි වේ. කාලාම සූත්‍රයේ දක්නට ලැබෙන්නේ එසේ සත්‍ය බහුත්‍වය නිසා පරම සත්‍ය කුමක්දැයි අවබෝධ කොටගත නොහැකිව අතරමන් වූ පිරිසකි.

තර්කයේ මාධ්‍ය භාෂාව යි. තර්කයේ දී ලොව සත්‍ය, අසත්‍ය තීරණය කරනු ලබන්නේ භාෂාව පදනම් කොටගෙන ය. නමුත් මුල් බුදුසමය දෙස බලන කල භාෂාව යනු හුදු උපකරණයකි. සමාජ ජීවිතයේ පහසුව සඳහා, තම අදහස් අන්‍යයන් වෙත ඉදිරිපත් කිරීම සඳහා භාවිත කරනු ලබන මෙවලමකි. එසේම භාෂාවෙන් නිර්මාණය වන සියල්ල සම්මුති මාත්‍රය. ප්‍රඥප්ති මාත්‍රය. චිත්ත නිර්මිත ය. අවිද්‍යා ජනක ය. යථාර්ථයෙන් බැහැර ය. මෙසේ භාෂාව මඟින් ලොව යථාර්ථය පෙන්වා දිය නොහැකි බව බුදුදහම තරයේ අවධාරණය කොට දක්වා ඇත. ප්‍රථමාභිසම්බෝධියේ දී බුදුරජාණන් වහන්සේ ධර්මය දේශනා නොකර සිටීමට අදහස් කරන ලද්දේ ද මෙම භාෂාව පදනම් වූ ගැටලුව නිසා යැයි සිතිය හැක.[18] ම.නි. චංකී සූත්‍රයෙහි වාද පථයන්ගෙන් ඉක්ම වූ නිවන භාෂාවේ ප්‍රතිඵලයක් වූ තර්කය මඟින් කිසිසේත් ම වටහාගත නොහැකි බව දක්වා ඇත.

***''සබ්බෙසු ධම්මෙසු සමූහතෙසුසමූහතා වාද පතාපි සබ්බෙ''***

එසේම දී.නි. පොට්ඨපාද සූත්‍රයේ දී ද තර්කයේ මාධ්‍යය වූ භාෂාව යම් යම් දේ පැහැදිලි කරන්නට අවශ්‍ය බවත්, භාෂාවේ ව්‍යවහාරික සීමාවන් අවබෝධ කොටගත් අය විවිධ ප්‍රඥප්තීන්ට අනුව භින්නරුචික වූ සමාජයට විෂය වන අයුරින් ධර්මය දේශනා කිරිමේ දී භාෂාමය හා තාර්කික සංකල්ප යොදාගන්නා බව දැක්වේ.

මීට අමතරව දී.නි. බ්‍රහ්මජාල සූත්‍රය, දී.නි. සාමඤ්ඤඵල සූත්‍රය, සෝණදණ්ඩ සූත්‍රය ආදී සූත්‍ර දේශනා විමසා බැලීමේ දී, බුදුරජාණන් වහන්සේ තර්ක පර්යාගත ධර්ම ප්‍රතික්ෂේප කරන අවස්ථා රාශියක් දක්නට ලැබේ. උදාන පාලියේ ***"එවං ඔභාසිතමෙව තක්කිකානං යාව සම්මාසම්බුද්ධා ලොකෙ නුප්පජ්ජන්ති"***[19] තාර්කිකයන් ලොව වැජඹෙන්නේ බුදුවරු ලාව පහළ වන තුරු පමණක් බව සඳහන් වේ.

## නිගමනය

මේ ආදී සූත්‍රාගත කරුණු අනුව විමසා බැලීමේ දී ඥානමාර්ගයන් ලෙස තර්කයේ යම් සප්‍රයෝජනතාවයක් දක්නට ලැබුණ ද, සත්‍යාවබෝධයේ දී එය ප්‍රතික්ෂේපිත වූ, නිෂ්ප්‍රයෝජන මාර්ගයක් ලෙස බුදුසමයේ පෙන්වා දී ඇත.

---

[1] අං.නි. කාලාම සූත්‍රය
[2] ඛු.නි. උදාන පාළි
[3] අභිධර්ම පිටකය, ධම්මසංගණි ප්‍රකරණ
[4] ජාතකඃ ම. අපණ්ණක සුත්ත
ථෙරවාද න්‍යාය, හැගොඩ ඛේමානන්ද හිමි, 100 පිටුව.
[5] ඇරිස්ටෝටල්
[6] මුල් බුදුසමය සාමයික පසුබිම, දේවාලේගම මේධානන්ද හිමි, ප්‍රථම මුද්‍රණය, 100 පිටුව.
[7] එම.
[8] සුත්ත නිපාතය
[9] සං.නි.
[10] ම.නි. උපාලි සුත්ත
[11] ම.නි. සංගාරව සුත්ත
[12] ම.නි. අචෙලකස්සප සුත්ත
[13] අං. නි. කාලාම සුත්ත
[14] එම
[15] ම.නි. සන්දක සුත්ත
[16] සු.නි. කලහවිවාද සුත්ත
[17] දී.නි. බ්‍රහ්මජාල සුත්ත
[18] ම.නි. අරියපරියෙසන සුත්ත
[19] ඛු.නි. උදාන පාළි

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

අභයසිංහ න්‍යායාචාර්ය, *භාරත තර්ක ශාස්ත්‍රය*, එම්.එම්. ප්‍රකාශන, කොළඹ 05, 1965.

කළුපහන, ජිනදාස, *භාරතීය දර්ශන ඉතිහාසය*, ගුණසේන සහ සමාගම, කොළඹ, 1963.

ඥාණිස්සර හිමි, ඇල්පිටියේ,. ගුණරත්න, ආර්.ඩී. *නවීන තර්ක ශාස්ත්‍රය හා භාරතීය තර්ක ශාස්ත්‍රය,* ගුණසේන සහ සමාගම, කොළඹ, 1985.

ජයතිලක, කේ.එන්. *මුල් බුදුසමයේ ඥානවිභාගය,* ගොඩගේ ප්‍රකාශන, කොළඹ 10, 2003.